

මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න මහතා

## මහාචාර්ය ඩබ්ලිව්. ඇස්. කරුණාරත්න

පූජ්‍ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගොඩුඹ උපාලි හිමි

බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි අභිවෘද්ධිය සඳහා විසි වන සියවසෙහි යුග මෙහෙවරක් ඉටු කළ, විසි වන සියවසෙහි පහළ වූ, අසීත උද්‍යෝගීමත් පඬිරුවනක් වශයෙන් මහාචාර්ය ඩබ්ලිව්. ඇස්. කරුණාරත්න මහතාණන් හඳුන්වා දිය හැකි ය. එතුමාණන් අතින් බෞද්ධ දර්ශනයට හා බෞද්ධ සංස්කෘතියට සිදු වූ සේවාව ඉතා විශාලය. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි එතෙක් පැවැති සාම්ප්‍රදායික ආගමික අධ්‍යයන ක්‍රමය එනම් පෞද්ගලික භක්ති මාර්ගයක් ලෙස ආගම හැදෑරීම වෙනුවට ශාස්ත්‍රීය ප්‍රවේශය හඳුන්වා දීමෙහි පුරෝගාමීයෙකු වශයෙන් කටයුතු කළ මහාචාර්ය ඩබ්ලිව්. ඇස්. කරුණාරත්නයන් සෙසු උගතුන් අතර නො දෙවෙනි තැනක් උසුලති. කිසියම් ආගමික ඉගැන්වීමක ඇතුළත් කරුණු අපක්ෂපාතීව විමසා බැලීම ශාස්ත්‍රීය ප්‍රවේශයෙහි පදනම වෙයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකු වශයෙන් තම ශාස්ත්‍රීය සේවාව ආරම්භ කළ දින පටන් සිය අභාවය දක්වා ම බෞද්ධ පොතපත විචාරාත්මකව අධ්‍යයනය කිරීමේ වැදගත්කම මහාචාර්ය කරුණාරත්නයන් අතින් විද්‍යාර්ථීනට පැහැදිලි කෙරිණ. එතුමාගේ හදිසි අභාවය හේතුවෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට එතුමාගෙන් ඉටු වීමට ඉතිරිව තිබුණු නොයෙක් ශාස්ත්‍රීය සේවාවන් අහිමි වී ගියේය.

1928.12.25 දින උපත ලැබූ මහාචාර්ය ඩබ්.ඇස්. කරුණාරත්න මහතා සොහොයුරු සොහොයුරියන් පස්දෙනෙකුගෙන් යුක්ත වූ පවුලක දෙවැන්නා විය. පොලිස් නිලධාරියෙකු වූ විජේසිංහ චාර්ල්ස් කරුණාරත්න මහතා එතුමාණන්ගේ පියා වූ අතර දොන චාලිට්වන් දිසානායක කරුණාරත්න මැතිණිය මව වූවාය. තම ජීවිතයේ මුල් කාලයේ සිට ම තම අනාගත හැකියාවන් මොනොවට විදහා දක් වූ එතුමා ප්‍රත්‍යන්ත නගරයක් වූ බදුල්ලේ ධර්මදූත විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබීය. පියාණන්ගේ ස්ථාන මාරුවීමත් සමග අගනුවරට පැමිණි කරුණාරත්න ශිෂ්‍යයාට ආනන්ද විද්‍යාලයට ඇතුළත් වීම සඳහා තම දක්ෂතාවන් ඔප්පු කිරීමට සිදුවීය. ආනන්ද විද්‍යාලයේ අති දීප්තිමත් ශිෂ්‍යයෙකු වශයෙන් ශාස්ත්‍රෝද්ග්‍රහණය